# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## 2023 අධ්‍යයන වර්ෂය සඳහා
## බාහිර උපාධි පාඨමාලා සඳහා අයදුම්කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ පහත සඳහන් බාහිර උපාධි පාඨමාලා සඳහා නවක විද්‍යාර්ථීන් බඳවා ගැනීමට **www.cdce.kln.ac.lk** යන වෙබ් අඩවිය මගින් **2023.11.15** සිට **2023.12.15** දක්වා මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| **පාඨමාලාව** | **පාඨමාලා ගාස්තුව (මෙය වාරික 05කින් ගෙවීම් කළ හැකිය)** | **පාඨමාලා කාලය** | **පාඨමාලා මාධ්‍යය** |
|---|---|---|---|
| **ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 86,000.00 | වසර තුනකි | සිංහල |
| **ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 120,000.00 | වසර තුනකි | සිංහල / ඉංග්‍රීසි |
| **වාණිජ විද්‍යාවේදී විශේෂ (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 162,500.00 | වසර හතරකි | සිංහල / ඉංග්‍රීසි |
| **විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 300,000.00 | වසර තුනකි | ඉංග්‍රීසි |

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

01. 2022 හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස (උසස් පෙළ) සමත් අපේක්ෂකයින්
02. කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කර ඇති වෙනත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්.

**සටහන**

- විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීමේදී අ.පො.ස (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාව හදාරා සංයුක්ත ගණිත විෂය සමත් වීම අනිවාර්ය වේ.
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) දෙවන මට්ටම සම්පූර්ණ කොට ඇති අපේක්ෂකයින් හෝ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 හෝ ඉහළ සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ට ද අයදුම් කළ හැකිය

මේ සම්බන්ධව වැඩි විස්තර දැන ගැනීම සඳහා:-

වෙබ් අඩවියට පිවිසෙන්න -www.cdce.kln.ac.lk

දු. අ. - 011-2987000, 011-2987001, 011-2987002, 011-2987005
විද්‍යුත් ලිපිනය - cdce@kln.ac.lk

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
2023.10.25